ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය
-----------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 30 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගෙවීම් කිරීමට සිදු නොවන බවට තීරණය කරන ලද එකතුව රු. 17,337,497 ක් වූ ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය තුලදී ආදායමට ගෙන තිබුණ ද ඊට අදාල ණයගැති වෙන්කිරීම් රු. 16,131,966 ක් සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | කර්මාන්ත ණයහිමි ශේෂ ආදායමට ගැනීමේදී ඊට අදාල ණයගැති ශේෂය ද හඳුනාගෙන ඉවත්කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) | ඉකුත් වර්ෂවලට අදාල මුද්දර ගාස්තු ඌන වෙන්කිරීම් රු.16,085,176 ක් සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි. | ඉකුත් වර්ෂවලට අදාල ආදායම් සමුච්චිත අරමුදල මඟින් ගැලපීම් කළ යුතුවේ. | ගිණුම් තැබීමේ දෝෂයක් සිදුව ඇතත්,පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් අදාල මුදල් සභාවේ කටයුතු සඳහා යොදා ගැනීමේ අවශ්‍යතාවය මත එසේ සිදුකරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ශේෂය රු. 5,763,488 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ණය ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ගිණුම් සකස් කිරීමේදී සිදුව ඇති වරදක් බවත්, ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ඈ) | දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොළිය රු. 1,084,240 ක් මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර, ඉන් රු. 1,000,000 ක් සමුච්චිත අරමුදලට ගැලපුම් කර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් අපහරණය කිරීමට නිර්දේශිත වත්කම් අපහරණය කිරීමට පෙර පොත්වලින් ඉවත්කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් රු. 344,169 කින් අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම් අපහරණය කිරීමෙන් පසු අදාල වත්කම් ලේඛන වලින් ඉවත්කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල වර්ෂයේම වෙන්දේසි භාණ්ඩවල හා විනාශකරන භාණ්ඩවල වටිනාකම පොත්වලින් ඉවත්කර එම භාණ්ඩ වෙන්දේසියේ ආදායම ඊළඟ වර්ෂයේ දී ආදායමට ගන්නා බව දන්වමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු. 314,559 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (උ) | 2019 වර්ෂය සඳහා විගණන ගාස්තු ප්‍රතිපාදනය කර නොතිබුණි. | විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් සිදුකළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ඌ) | ගිණුම් විෂයයන් 10 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 27,123,853 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන අතර පවත්නා වෙනස්කම් ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

### නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 1995 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය තුල අවස්ථා 66 කදී ලබාදී තිබූ එකතුව රු. 2,238,382 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නගර සංවර්ධන කටයුතු සඳහා ලබාගෙන ඇති අත්තිකාරම් නාගරික සංවර්ධන ගිණුමෙන් පියවා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියට යවා ඇති බවත්, අනෙකුත් අත්තිකාරම් ද පියවා ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571 | 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල එකතුව රු. 1,850,056 ක් වූ තැන්පතු ශේෂ හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල තැන්පතු රු. 151,417 ක් ආදායමට ගත් බව දන්වමි. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන බව දන්වමි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යයසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගත යුතුවේ. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සහාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 1.5 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු කල අගය මත බදු, පිරිවැටුම් බදු හා ජාතිය ගොඩනැඟීමේ බදු තැන්පත් ගිණුම්වල 2015 වර්ෂයට පෙර සිට පැවතඑන එකතුව රු. 1,962,284 ක ශේෂ හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කලයුතු ශේෂ වේ නම් ඒවා නොපමාව ප්‍රේෂණය කිරීමටත්, ඉතිරිය හඳුනාගෙන නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුවේ. | මෙම තැන්පතු වලින් ගෙවීම් සිදුකර ඇතත්, ඒවා නිවැරදිව ගිණුම්ගත වී නොමැති බවත් පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,711,216 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,498,730 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 කට වැඩි කාලයක් අක්‍රිය තත්ත්වයේ පවතින රු. 225,354 ක ශේෂයක් සහිත බැංකු ගිණුමක් ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට හෝ වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | බැංකු ගිණුම ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට හෝ වසා දැමීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි මාස 03 තුලදී මහා සභාවට ඉදිරිපත් කර මෙම ගිණුම් ශේෂය සභාවේ ජංගම ගිණුමට මාරුකිරීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,670,500 | 8,989,609 | 6,869,587 | 17,602,784 | 8,716,500 | 8,911,406 | 7,025,062 | 15,858,134 |
| කුලී | 10,464,150 | 10,111,520 | 10,062,445 | 383,200 | 9,177,600 | 8,558,020 | 8,562,817 | 682,884 |
| බලපත්‍ර ගාස්තු | 1,019,000 | 981,549 | 982,299 | 14,750 | 1,122,300 | 1,042,271 | 1,051,621 | 5,750 |
| වෙනත් ආදායම් | 28,323,250 | 26,145,738 | 30,932,111 | 29,149,819 | 24,580,400 | 24,083,720 | 20,802,729 | 23,407,099 |
| | 49,476,900 | 46,228,416 | 48,846,442 | 47,150,553 | 43,596,800 | 42,595,417 | 37,442,229 | 39,953,867 |

#### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 1932 කින් අයවියයුතු රු. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර | අයකරගත නොහැකි බවට හඳුනාගත් හිඟ වරිපනම් කපාහැරීම සඳහා මේ වනවිට ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට යොමු |

| | | |
|---|---|---|
| 8,954,421 ක් වූ හිඟ ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ගැනීමට කටයුතු කළ යුතුවේ. | කර ඇති බවත්, ජංගම සේවා පවත්වා හිඟ වරිපනම් නොගෙවන අයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගෙන ඇති බවත් දන්වමි. |

**(ආ) අක්කර බදු**

------------

| | | |
|---|---|---|
| වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 149 කින් අයවිය යුතු රු. 183,157 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අක්කර බදු සතොයක්ෂණයක් සිදුකර හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් හිමිකරුවන් පිළිබඳ තොරතුරු සොයා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා ගොවිජන සේවා කාර්යාලයේ සහයෝගය ලබාගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.3.3 බලපත්‍ර ගාස්තු**

----------------

**පරිසර බලපත්‍ර**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිසර බලපත්‍ර ලබාගත යුතු බවට ඉකුත් වර්ෂයේදී හඳුනාගෙන තිබූ ව්‍යාපාරික ආයතන 24 ක් බලපත්‍ර ලබා නොගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර, එමඟින් සභාවට රු. 96,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන වෙත විධිමත්ව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | දින 14 ක් තුල පරිසර බලපත්‍ර ලබාගන්නා ලෙස දන්වා යවා ඇති බවත්, ඊට ප්‍රතිචාර නොදක්වන ආයතන සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වමි. |

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බවට හඳුනාගෙන තිබූ උසාවි දඩ රු. 2,348,000 ක් වූ අතර, අයවිය යුතු මුද්දර ගාස්තු රු. 9,230,836 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ශේෂයන් 2020 වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | තිරසර සංවර්ධන සැලසුම් 2020 වර්ෂයේදී සකස් කර ඇති බව දන්වමි. |

### 3.2 වත්කම් කළමනාකරණය

**නිෂ්කාර්යය වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකරුවෙකු නොමැති වීම හේතුවෙන් සභාව සතු මෝටර් ග්‍රේඩරය 2015 වර්ෂයේ සිට නිෂ්කාර්යයව පැවතුණි. | ඵලදායී ලෙස උපයෝජනය කිරීමට හෝ අවශ්‍යතාව සහිත පළාත් පාලන ආයතනයක් වෙත ලබාදීමට කටයුතු කළ යුතුවේ. | අදාල මෝටර් ග්‍රේඩරය කොළොන්න ප්‍රාදේශිය සභාව සමඟ වාහන හුවමාරුවක් කිරීමට කටයුතු කරගෙන යන බව දන්වමි. |
| (ආ) | 2013 වර්ෂයේදී ගර්භිත කර තිබූ කැබ් රථයක් අපහරණය කර නොතිබුණි. | ගර්භිත වාහන අපහරණය කළ යුතුවේ. | අදාල කැබ් රථය වෙන්දේසි කිරීම පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මාර්ගයෙන් සිදුකළ යුතුව ඇති බැවින් එම කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |

## 3.3 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනත මඟින් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ චක්‍රලේඛයකින් ලබාදී ඇති අධිකාරී බලයකින් තොරව 2018 අගෝස්තු 14 දිනැති අංක 136 දරන සභා තීරණය මත, මහජන නියෝජිත මාසික දීමනාව මෙන් දස ගුණයක මුදලක් ණය අත්තිකාරමක් ලෙස මහජන නියෝජිතයින්ට ලබාදී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. 2,251,800 ක් අයවිය යුතුව පැවතුණි. | මහජන නියෝජිතයින් වෙත ණය අත්තිකාරම් ලබාදීම සඳහා ලිඛිත නීතියක් යටතේ ප්‍රතිපාදන සලසා දී නොමැත. | මෙම ණය මඟින් සභාව වෙත සියයට 4.2 ක පොළී ආදායමක් ලැබෙන බවත් සභිකවරුන්ගේ මාසික දීමනාවෙන් ණය වාරික අයකර ගනිමින් පවතින බවත් දන්වමි. |

## 3.4 ප්‍රසම්පාදනය

### කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මෝරගල අරඹබඩ මාර්ගයේ නායගිය ස්ථානයේ පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තය සඳහා වැඩිපුර ගෙවා තිබූ රු. 39,001 ක් කොන්ත්‍රාත්කාර සමිතියෙන් අයකරගන්නා බව විගණනය වෙත දන්වා තිබුණද, එම වටිනාකම අඩුකර ගැනීමකින් තොරව කර්මාන්තයේ රඳවුම් මුදල 2018 දෙසැම්බර් මස කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුවේ. | වැඩිපුර ගෙවා ඇති රු. 39,001 ක් අදාල සමිතියෙන් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### නොවිසඳී ඇති නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට 1 කට සමාන බද්දක් ප්‍රාදේශීය සභාව වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් අදාල තොරතුරු ලබාගෙන හිඟ ආදායම් ගණනය කර අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාවේ ආදායම් පරීක්ෂකවරුන්ට මෙම කාර්යය පැවරුවද ඔවුන් නවක නිලධාරීන් නිසා එම කාර්යය ඉටුකර ගැනීමට නොහැකි වූ බවත්, සභාවේ නීතිඥවරයාගේ සහාය ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරන බවත් දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිවුරුම්පිටිය නරියාමුල්ලහේන ඉඩම් වෙන්දේසියේදී පොදු කටයුතු සඳහා වෙන් කල භූමියෙන් පර්චස් 22.61 ක් අඩුවෙන් සභාවට පවරා දී තිබුණි. | නියමිත භූමි ප්‍රමාණය පවරා ගැනීමට හෝ එහි වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල භූමි ප්‍රමාණයේ වටිනාකම තක්සේරු කර වෙන්දේසිකරුගෙන් අයකර ගැනීමට ක්‍රියාකරන බව දන්වමි. |
| (ඇ) | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වසර 05 කට වරක් තක්සේරු කල යුතු වුවත්, 2012 වර්ෂයෙන් පසු දේපල තක්සේරුවක් සිදුකර නොතිබුණි. | වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී දේපළ තක්සේරු කිරීමට කටයුතු සූදානම් කර තිබුණද, පැවති වසංගත තත්ත්වය හේතුවෙන් රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත එම කාර්යය වසර 02 කින් කල් දැමීමට සිදුව ඇති බව දන්වමි. |